# ජාතික අධ්‍යාපන ආයතනය

# අයදුම්පත් කැඳවීම

## සංඥා භාෂාව පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාව සහ සහතික පත්‍ර පාඨමාලාව 2024

ජාතික අධ්‍යාපන ආයතනයේ අන්තර්කරණ අධ්‍යාපන දෙපාර්තමේන්තුව මගින් මෙහෙයවනු ලබන උක්ත පාඨමාලා සඳහා අයදුම්පත් කැඳවනු ලැබේ.

**පාඨමාලාවේ ස්වභාවය**

සංඥා හඳුනා ගැනීම, සංඥා භාෂාවෙන් අදහස් හුවමාරු කිරීම, සංඥා භාෂා පරිවර්තනය සහ සංඥා භාෂාවෙන් ඉගැන්වීම පිළිබඳව නිපුණතා ලබාදීම මෙහි අරමුණ වේ. එක් අවුරුදු අර්ධකාලීන සති අන්ත පාඨමාලාවක් වන මෙහි අධ්‍යයන සැසි මාර්ගගත ක්‍රමය ඔස්සේ සහ ජාතික අධ්‍යාපන ආයතනයේදීත්, ප්‍රායෝගික සැසි විශේෂ පාසල් වලදීත් පැවැත්වීමට කටයුතු සම්පාදනය කර ඇත. උසස් අධ්‍යාපන අමාත්‍යාංශය විසින් පාඨමාලා සඳහා සකස් කර ඇති ශ්‍රී ලංකා සුදුසුකම් රාමුව (Sri Lanka Qualifications Framework) අනුව මෙම පාඨමාලාව සකස් කර ඇත.

1. සංඥා භාෂාව පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාව (SLQF – Level 3)

**අයදුම් කිරීම සඳහා සුදුසුකම්**

අධ්‍යයන පොදු සහතික පත්‍ර උසස් පෙළ විභාගය සමත් වීම **සහ**

රජයේ හෝ රජයේ අනුමත පාසලක හෝ පිරිවෙනක ගුරුවරයකු වීම **හෝ**

ජාතික අධ්‍යාපන විද්‍යා පීඨයක / ගුරු විද්‍යාලයක ගුරු අධ්‍යාපනඥයකු වීම **හෝ**

ශ්‍රී ලංකා විදුහල්පති සේවයේ ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ නිලධාරියකු වීම **හෝ**

ජාතික අධ්‍යාපන ආයතනයේ අධ්‍යයන කාර්ය මණ්ඩලයේ නිලධාරියෙකු වීම **හෝ**

විශේෂ අධ්‍යාපන අවශ්‍යතා සහිත දරුවන් සම්බන්ධව කටයුතු කරන පාසලක/ ආයතනයක/ දෙපාර්තමේන්තුවක සේවයේ නියුක්තව සිටීම **සහ**

2024.11.15 දිනට වයස අවුරුදු 55 ට අඩු වීම

2. සංඥා භාෂාව පිළිබඳ සහතික පත්‍ර පාඨමාලාව (SLQF – Level 2)

**අයදුම් කිරීම සඳහා සුදුසුකම්**

2024.11.15 දිනට වයස අවුරුදු 55 ට අඩු වීම

අ.පො.ස. (සා. පෙළ) සමත් අයෙකු වීම **සහ**

විශේෂ අධ්‍යාපන අවශ්‍යතා සහිත දරුවන් සම්බන්ධ ව කටයුතු කරන පාසලක /ආයතනයක / දෙපාර්තමේන්තුවක සේවයේ නියුක්තව සිටීම.

**පාඨමාලා ගාස්තු**

| ගාස්තු | ඩිප්ලෝමා පාඨමාලාව | සහතික පත්‍ර පාඨමාලාව |
|---|---|---|
| අයදුම්පත් ගාස්තු | 200.00 | 200.00 |
| ලියාපදිංචි ගාස්තු | 1,000.00 | 1,000.00 |
| පාඨමාලා ගාස්තු | 40,000.00 (වාරික 2 කින් ගෙවිය හැකිය) | 25,000.00 (වාරික 2 කින් ගෙවිය හැකිය) |

✓ සියලුම ගෙවීම් බැංකු කාඩ්පත් මගින් (Credit හා Debit) සිදු කළ හැකිය

**මාධ්‍යය - සිංහල**

**අයදුම් කළයුතු පිළිවෙළ**

ඉහත සඳහන් සුදුසුකම් සපුරා ඇති අයදුම්කරුවන් ජාතික අධ්‍යාපන ආයතනයේ විභාග දෙපාර්තමේන්තුවේ නිල වෙබ් අඩවියට පිවිස https://www.exams.nie.lk/intakes/new යොමුව ඔස්සේ මාර්ගගතව පමණක් අයදුම්පත්‍ර යොමු කළ යුතු ය. මාර්ගගතව අයදුම්පත් යොමු කිරීම සම්බන්ධයෙන් අවශ්‍ය උපදෙස් පහත යොමුව මගින් ලබාගත හැක. (https://www.exams.nie.lk/info/applying-for-new-enrollments)

විමසීම් – අයදුම්පත්‍ර යොමු කිරීමේදී ඇතිවන ගැටලු සඳහා – (0117601776/ 0117601777)
පාඨමාලාව පිළිබඳ තොරතුරු දැනගැනීම සඳහා – (0117601656/ 0117601657/ 0117601661)
අයදුම් කළ යුතු අවසාන දිනය – 2024/11/15

**පාඨමාලාවට තෝරා ගැනීම**

- සම්මුඛ පරීක්ෂණයක් මගින් සුදුස්සන් තෝරා ගනු ලැබේ.

**අධ්‍යක්ෂ ජනරාල්,**
**ජාතික අධ්‍යාපන ආයතනය, මහරගම.**
**2024.10.18**

tamilguru.lk